රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :17/2014

මගේ අංකය : EST-1/MISCL/06/0047
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2014.07.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව අර්ථ දැක්වීම</u>**

ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයට 2012.12.31 දින තෙක් සිදු කළ සංශෝධන ඇතුළත් කරමින් 2013.07.08 දිනැතිව නිකුත් කළ සංශෝධිත ආයතන සංග්‍රහය ආරම්භයේ ඇතුළත් කර ඇති මාගේ ප්‍රකාශය කෙරේ ඔබගේ අවධානය යොමු කරවමි. ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ අර්ථ නිරූපණයේ දී ඇතිවන සැක උපදවන තැන් හා ගැටළු ද එහි විධිවිධානයන්ගෙන් ආවරණය නොවන කරුණු ද විමසිය යුත්තේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් බව එහි 3 වන ඡේදයෙහි පැහැදිලිව සඳහන් කර ඇත. එසේම 2012.09.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2012 මඟින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු විෂයයන් හා ඒවා ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳව ද ඔබ වෙත දැනුම් දී ඇති බව අවධානයට යොමු කරවමි.

02. එසේ වුව ද රාජ්‍ය ආයතන විසින් විවිධ අවස්ථාවල ආයතන සංග්‍රහයේ විධිවිධාන විවිධ අයුරින් අර්ථ නිරූපණය කරමින් ක්‍රියා කරන බව පසුගිය කාල වකවානුව තුළ නිරීක්ෂණය වී ඇත. මෙසේ විවිධ රාජ්‍ය ආයතනවල බලධරයන් තම තමන්ගේ පුද්ගලික අදහස් හා වටහා ගැනීම් අනුව ආයතන සංග්‍රහයේ විධිවිධානයන් පිළිබඳ අර්ථ දැක්වීම් මත ගෙන ඇති තීරණ හේතුවෙන් රාජ්‍ය සේවයේ විවිධ සේවාවන් හා ආයතන අතර ආයතනික හා පරිපාලන ගැටළු මතු වී ඇත.

03. සමස්ත රාජ්‍ය සේවයටම අදාළ වන ආයතනික තීරණවල සමරූපීභාවයක් තිබිය යුතු වුව ද විවිධ පළාත් සභා තම පරිපාලන කාර්යයන් සඳහා සමරූපී නොවන ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් පළාත් රාජ්‍ය සේවයේ හා මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයන් සම්බන්ධ පරිපාලන කටයුතුවල දී මතුවන නොගැළපීම් මත ආයතනික ගැටළු මෙන්ම මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුකරවලට රාජ්‍ය නිලධරයන් යොමුවීමේ ප්‍රවණතාවක් ද මෑතක සිට දක්නට ලැබී ඇත.

04. එබැවින් මධ්‍යම හා පළාත් රාජ්‍ය සේවාවන්හි සමාන තත්ත්වයේ නිලධරයන් සම්බන්ධයෙන් පරිපාලන මෙන්ම ආයතනික කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ දී සමස්ත රාජ්‍ය සේවයටම සමරූපී වන අන්දමින් තීරණ ගත යුතු බව හා එකම තනතුරකට නිලධරයන් විටින් විට බඳවා ගැනීමේ දී සමාන අන්දමින් කටයුතු කළ යුතු බව සම්බන්ධයෙන් සියලුම නිලධරයන් දැනුවත් කිරීමට ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන මෙන් දන්වමි.

05. ඉහත පරිදි කටයුතු කිරීමේ දී ආයතන සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයන් පැන නගින්නේනම් එකී විධිවිධාන පිළිබඳව අර්ථ නිරූපණය කරගැනීම හා උපදෙස් ලබා ගැනීම ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් පමණක් කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය